ගොවි කටයුතු අධ්‍යයන 1 (i) (1984) 53 – 54

# ග්‍රන්ථ විවේචන

**එළවළු මිළ කෙරෙහි බලපාන සාධක : පි. ජේ. ගුණවර්ධන හා අතුල චන්ද්‍රසිරි. කොළඹ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, පර්යේෂණ අධ්‍යයන මාලා අංක 35** පිටු xiii – 182.

මෙරටේ සිංහලයෙන් නිකුත් කෙරෙන පර්යේෂණ අධ්‍යයන ග්‍රන්ථ මාලාවට මෙම පර්යේෂණය එක්වීම අගය කළයුතු ප්‍රයත්නයකි.

මෙරටේ පාරිභෝගිකයා, මාසික වියදමින් සියයට දහයක් පමණ වැය කරන එළවළු පිළිබඳව සිදු කෙරුණ මෙම අධ්‍යයනය, අදළ ක්ෂේත්‍රයේ මෙතෙක් සිදු කෙරුන සවිස්තරාත්මක අධ්‍යයනයන්ගෙන් එකකි. මෙතෙක් සෞම්‍ය කලාපිය එළවළු වලට සීමාවී තිබූ පර්යේෂණ දේශීය එළවළු වර්ග වලටද ව්‍යාප්ත කිරීම මෙම අධ්‍යයනයේ එක් අගය කළයුතු අංගයකි. කොටස් තුනකට බෙද වෙන් කළ හැකි මෙම අධ්‍යයනයේ මුල් පරිච්ඡේද තුන වෙන්වී ඇත්තේ එළවළු මිළ ගණන් වල ප්‍රවනතාවයන්, කාලීන විචල්‍යතාවයන් අවබෝධ කර ගැනීම හා ඒවාට තුඩුදෙන සාධක පරීක්ෂා කිරීමටය. මේ කාර්යේදී, එළවළු නිෂ්පාදනයට අදාල විවිධ පුද්ගලයන්ගේ බලපෑම් නිසා වෙළඳ පොලේ එළවළු මිලෙහි වන විචල්‍යයන් හා ඒවා සිදුවන කාල සීමාවන්ද මෙම කොටසින් සංක්ෂිප්තව ඉදිරිපත් වී තිබේ.

ගොවිපල මට්ටමේ එළවළු සැපයීමට අදල මෙහි සිව්වන පරිච්ඡේදය, මේ රටේ සුළු ගොවි ජනතාවගේ ජීවන රටාවේ ගැටළු පෙන්වන කැඩපතක් වැන්න. එළවළු වගා කිරීමේදී ඔවුන්ට අවශ්‍ය පොහොර රසායනික ද්‍රව්‍ය හා වගා ණය ආදිය ලබා ගැනීමට ඇති අපහසුකම්ද, යෙදවුම් වෙළඳ පොලේ අනපේක්ෂිත මිළ වැඩිවීම, නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී නිසි මිලක් නොලැබීම, නාස්තිය හා නිසි ගබඩා පහසු කම් නොමැතිවීම මින් ප්‍රධාන තැනක් ගනී. පවුලේ ශ්‍රමයට නිසි මිලක් නොලැබීම ගොවි ජීවිතයේ ඛෙදවාචකයයි. ගොවියාට ලැබී ඇත්තේ පාරිභෝගිකයාට ගෙවන මුදලින් අඩකටත් අඩුවෙන් බවද හෙළිවී ඇත. මේ කරුණු එළවළු ගොවියා සම්ප්‍රදායික එළවළු වගාවෙන්, වඩාත් ලාභදයක වගාවන් කෙරෙහි යොමුකර වීමට හේතුවී ඇත.

වෙළඳ පොල පිළිබඳව විග්‍රහ කෙරෙන ඊළඟ පරිච්ඡේදය අලෙවි කරණය පිළිබඳව විවිධ න්‍යායන්ට මූලාශ්‍ර සපයන්නකි. මෙරට එළවළු අලෙවි රටාවේ අපූර්ණ ස්වභාවය නිසා, පාරිභෝගිකයා ගෙවන මිලෙන් අඩක් පමණ සේවා සඳහා වැය කිරීමට සිදුවී ඇති අයුරුද එම පරිච්ඡේදයෙන් නිරූපනය වේ. එලෙසින්ම, කාර්යක්ෂම වෙළඳ රටාවක් ඇති කිරීම සඳහා රජය මගින් ගනු ලැබූ පියවරයන්ගේ සාර්ථක බව හඳුනා ගැනීමටද මෙම කරුණු උපයෝගි කරගත හැකිය.

9071

පස්වන පරිච්ඡේදයේදී පාරිභෝගිකයා දෙස නෙත් යොමු කරන අධ්‍යයනය, ඒ පිළිබඳව වැදගත් කරුණු කිහිපයක් අවධාරණය කරයි. විශේෂයෙන් වෙළඳ පොලෙහි පාරිභෝජනය සඳහා ඇති එළවළු ප්‍රමාණය හා වෛද්‍ය පර්යේෂණාගාර නිගමනයන් අනුව, අවශ්‍ය එළවළු ප්‍රමාණය හා කරන සැසඳීම් ඉතා වැදගත් වෙයි. ජාතික සංඛ්‍යා ලේඛන වල දුර්වලතා පැවතියද, මෙහිදී පෙන්වනුයේ ඒක පුද්ගල එළවළු පාරිභෝජනය අඩුවීමේ ප්‍රවනතාවයකි. පාරිභෝගිකයාගේ ක්‍රය ශක්තිය අනුව එළවළු ඉල්ලුමෙහි වෙනස්වීම් පිළිබඳව ඉදිරිපත් කොට ඇති කරුණු අතිශයින් වැඩදයකය.

මෙහිලා සඳහන් කළයුතු තවත් අංශයක් නම්, ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හෝ වෙනස් කිරීම් රටේ පොදු ජනතාවට ඇති කෙරෙන බලපෑම් පිළිබඳ කෙරෙන විග්‍රහයයි. රාජ්‍ය ප්‍රතිපත්ති නිසා, ගොවින්ගේ සම්ප්‍රදයික ගොවිතැන් රටාව වෙනස්වන ආකාරයද, සමස්ථ ප්‍රවාහන පද්ධතිය, සවිමත් කිරීම තුළින් වාසිදයක ප්‍රවාහන සේවාවක් රටට ලබාදීමේ අරමුණින් රජය මගින් වාහන ගෙන්වීම පාලනයෙන් ඉවත්කිරීම මගින් සිදුවී ඇති වෙනස්කම්ද එම අදහසට නිදසුන් සපයයි.

මේ කරුණු අනුව බලන කළ, මෙම අධ්‍යයනය, එයට අදල විෂය ක්ෂේත්‍රය මැනවින් විග්‍රහ කිරිමට අමතරව, මෙරටේ සමාජ ආර්ථීක හා පාලන රටාව පිළිබඳවද (සීය සීමාවන් වලට යටත්ව) විග්‍රහ කෙරෙන සාර්ථක අධ්‍යයනයක් ලෙස නිගමනය කිරීම අනුචිත නොවේ.

— ගුණරත්න රාමනායක